# බන්ධනාගාර දෙපාර්තමේන්තු පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය

## 01. බන්ධනාගාර රැඳවියන් බැලීම

- සැකකරුවකුට එක් වරකට තිදෙනෙකුට නොවැඩි ඥාතීන් හෝ හිතවතුන් සංඛ්‍යාවකට ඉරු දින හැර සතියේ සෑම දිනකම පැය (1/4) ක් අමුත්තන් බැලීම සඳහා අවස්ථාව සලසා ගත හැකිය.
- මරණීය දණ්ඩනය නියම වූ සිරකරුවන්හට හා අභියාචනා සිරකරුවන්හට සතියකට වරක්ද, සාමාන්‍ය සිරකරුවන් හට ලිත් මසකටවරක් දතිදෙනෙකුට නොවැඩි ඥාතීන් හෝ හිතවතුන් හට ඉරු දින හැර පැය (1/2) ක්අමුත්තන් බැලීම සඳහා අවස්ථාව සලසාගත හැකිය.
- නීති නිලධාරීන් සඳහා බන්ධනාගාරගතව සිටින සේවාලාභීන් හට සේවා සැපයීම හා නීති උපදෙස් ලබාදී[ම] වෙනුවෙන් අවශ්‍යතාවය සටහන්කර ලිපියක් සහ තම සේවා හැඳුනුම්පත සමග යොමුකර අවශ්‍යතාවය සපුරාගත හැකිය.
- පොලිස් හා විමර්ශන නිලධාරීන් සඳහා අදාල අධිකරණ නියෝගය හෝ බලය පැවරූ ලිපිය සමග තම සේවා හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් තම සේවය ලබාගත හැකිය.

➢ අමුත්තන් බැලීම සඳහා පැමිණෙන්නන් හට අප්‍රමාදව සේවාවන් ලබා ගැනීම සඳහා අදාල ආයතනයේ දුරකථන අංකයට හෝ ආයතනයේ විද්‍යුත් ලිපිනය මගින් තම ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි අතර එසේ නැතහොත් බන්ධනාගාර නිල වෙබ් අඩවියට පිවිස "PRISONS E VISIT" පහසුකම හරහා තම ඉල්ලීම් ඉදිරිපත්කර ප්‍රමාදවීම් වලක්වා ගත හැකිය.

➢ නීති නලධාරීන් සහ පොලිස් හා විමර්ශන නිලධාරීන් හට අප්‍රමාදව සේවාවන් ලබාගැනීම සඳහා අදාල ආයතන[යේ] දුරකථන අංකයට හෝ ආයතනයේ විද්‍යුත් ලිපිනය මගින් තම ඉල්ලීම් ඉදිරිපත්කල හැකිය.

## 02. බන්ධනාගාරයේ අනෙකුත් සේවාවන් ලබාගැනීම

- සිර සහතික
- රක්ෂණ භාර සහතික
- බන්ධනාගාරගතව නිදහස්වන අවස්තාවේ රැගෙනයාමට නොහැකිවූ නීත්‍යානුකූල හිමිකම් ඇති භාණ්ඩ ප[හ] මුදල් රැගෙන යාමට පැමිණෙන අවස්ථාවන්හිදී අදාල ආයතනයන්හි දුරකථන අංකය මගින් හෝ ආයතනයන්හී විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) මගින් ඉල්ලීම් ඉදිරිපත්කර ප්‍රමාදයන් වලකා ඉක්මනින් සේවාවක් ලබාගත හැකිය.
- විශ්ව විද්‍යාල පර්යේෂණ කටයුතු සඳහා පැමිණෙන අය සහ පාසැල් හෝ වෙනත් නිරීක්ෂණ චාරිකාවන් සඳහා පැමිණෙන අය බලය පැවරූ ලිපිය සමඟ තම අනන්‍යතා අයදුම් පත ඉදිරිපත් කර අදාල ආයතනයන්හි දුරකතන අංකය මගින් හෝ ආයතනයන්හි විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) මගින් තම ඉල්ලීම් ඉදිරිපත් කර ප්‍රමාදයන් වලකාගත හැකිය.
- සිර රැඳවියන්ගේ නීත්‍යානුකූල පදනමක් මත භාණ්ඩවල උකස් පත්‍රිකා, ඉඩම් පැවරුම්, වාහන පැවරුම්, වෙනත් නිශ්චල හෝ චංචල දේපල පැවරුම් සඳහා පැමිණෙන විට බන්ධනාගාර අධිකාරී වෙත යොමු කිරීමට ඉල්ලීම් ලිපියේ, ජාතික හැඳුනුම්පතේ සහ අනෙකුත් අදාල ලිපිවල මුල් පිටපත් හෝ පැහැදිලි සත්‍ය ඡායාපිටපත් බවට සහතික කරන ලිපිය සමග ඉල්ලීම් කළ යුතුය.
- බන්ධනාගාර ගතව සිටින සැක රැඳවියන්ගේ පූර්ව රැකියාවට අදාලව විශ්‍රාම වැටුප් හා මාසික වැටුප් ලබා ගැනීමට පැමිණීමේ දී අදාල ඉල්ලීම සමග වැටුප් කුවිතානසිය ඉදිරිපත් කල යුතුය.

➢ ඉහත සඳහන් සියලුම සේවාවන් සඳහා පැමිණෙන අය පිළිගැනීමේ නිලධාරීන් හට තම සේවා අවශ්‍යතාවය වාර්තා කිරීමෙන් අනතුරුව පැය 02ක කාලයක් ඉක්ම වූ පසු තම සේවා අවශ්‍යතාවය ඉටු නොවුයේ නම් ආයතනයේ දුරකථන අංකයෙන් සම්බන්ධීකරණ නිලධාරියාගෙන් විමසා එම අවශ්‍යතාවය සිදුකර ගත හැක.

➢ මෙම සියලු සේවාවන් සතියේ දිනයන්හි පෙ.ව.08.30 සිට ප.ව.04.00 දක්වා කාර්යාල වැඩ කරන කාලය තුලදී පමණක් ලබාගත හැකිය.